# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
## ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2014/15
## 2019 පෙබරවාරි - අප්‍රේල්
## සමාජීයවිද්‍යා පීඨය

## සංචාරණය හා සංස්කෘතික සම්පත් කළමනාකරණය
## රූ දෙස් සංචාරණය TCRM - E 3015

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. රූ දෙස් සංචරණ සංකල්පය නිර්වචන ඇසුරින් පහදන්න. රූ දෙස් සංචරණ සංකල්පයේ මූලධර්ම අට පිළිබඳව විමසීමක් කරන්න. (ලකුණු 20 යි)

02. තිරසර සංවර්ධනය සඳහා රූ දෙස් සංචරණ සංකල්පය බෙහෙවින් ඉවහල් කරගත හැකිය. මෙම ප්‍රකාශය පිළිබඳ විශ්ලේෂණයක් කරන්න. (ලකුණු 20 යි)

03. රූ දෙස් සංචරණය හා සොබා සංචරණය යන සංචරණ කාණ්ඩ අතර සමානතා හා විෂමතා කවරේදැයි නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 20 යි)

04. සංචාරක ගමනාන්තයක සංස්කෘතික උරුමය සුරකිනු වස් රූ දෙස් සංචරණයෙන් මනා පිටුබලයක් සැලසේ. මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේද? යෝග්‍ය නිදසුන් ඇසුරින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 20 යි)

05. ඕනෑම රූ දෙස් සංචාරක ගමනාන්තයක පැන නැඟිය හැකි ගැටලු හා බලපෑම් පිළිබඳව විශ්ලේෂණයක් කර එම බලපෑම් අවම කර ගැනීම සඳහා යෝග්‍ය නිර්දේශ ඉදිරිපත් කරන්න. (ලකුණු 20 යි)

06. ශ්‍රී ලංකාවේ ඔබ කැමති ඕනෑම පරිසර හිතකාමී හෝටලයක් තෝරා ගනිමින්, එහි මෙහෙයුම් ක්‍රියාවලිය තුළ පරිසර හිතකාමී ප්‍රතිපත්ති හා රූ දෙස් සංචරණ මූලධර්ම ක්‍රියාත්මක වන ආකාරය නිදසුන් ඇසුරින් විමසීමක් කරන්න. (ලකුණු 20 යි)

07. ජෛව විවිධත්ව උණුසුම් ස්ථානයක් (bio- diversity hotspots) වූද, යුනෙස්කෝ ස්වභාවික ලෝක උරුමයක් වූද, සිංහරාජ වැසි වනාන්තරය ආශ්‍රිතව වගකීමක් සහිත සංචරණය (responsible tourism)ප්‍රවර්ධනය කරන ආකාරය පිළිබඳ සාකච්ඡා කරන්න. (ලකුණු 20 යි)

08. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් (02) පිළිබඳ ප්‍රමාණවත් විස්තර සපයන්න. (2×10 = ලකුණු 20 යි)

    (අ) රූ දෙස් සංචාරක ක්‍රියාකාරකම්
    (ආ) ඉසිලීමේ ධාරිතාව ඉක්මවා යාම (exceeding carrying capacity) හා පාරිසරික බලපෑම් (ස්වභාවික පරිසර පද්ධති ආශ්‍රිත)
    (ඇ) රූ දෙස් සංචරණය හා පරිසර සංරක්ෂණය අතර සබඳතාවය
    (ඈ) රූ දෙස් සංචරණ සංකල්පයෙන් සංචාරක ගමනාන්තයක ඇතිවිය හැකි ආර්ථික බලපෑම්

******************************